# 1 හැඳින්වීම ක්‍රමවේද හා මූලාශ්‍ර

## 1.1 හැඳින්වීම

මිනිසා පරිනාමික අවධියේ සිටම ප්‍රධානතම සන්නිවේදන මාධ්‍ය කොට ගත්තේ තම ශරීරයයි. ශාරීරික චලනය සහ භාව ප්‍රකාශයන් එක්ව සැකසුනු ශාරීරික භාෂාව වාචික භාෂාවට වඩා ඉදිරියෙන් සිටී. මිනිසා යම්කිසි ප්‍රපංචයකින් ප්‍රක්ෂේපණය කරන්නා වූ අදහස ග්‍රහනය කිරීමට ප්‍රථමයෙන්ම ප්‍රේරණය කොට ගන්නේ ඊට අදාල රූපයේ ඇති භාෂාත්මක ශක්‍යතාවයයි.

විවිධ අභිචාරී ක්‍රම සහ සංකේතාත්මකව අදහස් ඉදිරිපත් කිරීමට සංචලනයන් යොදා ගැනීම මානවයාගේ මුල් යුගයේ සිටම ආරම්භව පැවත එන්නට ඇත. එහිදී ප්‍රධාන ප්‍රකාශක මාධ්‍ය වූයේ ශරීරයයි.

මිනිසාගේ වාචික සහ අවාචික සන්නිවේදන ක්‍රමවේදයන් අතර මුල් කාලීන ප්‍රාථමික භාෂාවට අයත් ප්‍රධාන මාධ්‍ය වනුයේ අවාචික සන්නිවේදනයයි. ප්‍රාථමික ශාරීරික භාෂාව මානව පරිණාමයේ මුල් යුගයේ සිට සන්නිවේදනය සඳහා යොදාගනු ලැබුණි. වානරයාගේ සිට හෝමෝසේපියන් මානවයා දක්වා පරිණාමය වීමේදී ඔහු විවිධ පාරිසරික හේතු සඳහා තම ශරීරය පාවිච්චි කිරීමට උත්සුක වූ අන්දම ඔහුගේ පරිණාමයේ විවිධ පියවරයන්ට හේතු විය. විවෘත චලන ක්‍රමවේදය තුල පවතින ත්‍රිමාන ගුණය හා ප්‍රකාශනාත්මක බව මුල් කාලීන ප්‍රාග් මානවයාගේ සිට අද වනතෙක් අදහස් සංජානනය සඳහා මිනිසා භාවිතාකරනු ලබයි. කොඳු ඇට පෙළෙහි සෘජු බව ඇතිවීම සමඟම මිනිසා ශාරීරික භාෂාව භාවිතයේ ප්‍රායෝගික හැකියාව ලැබූ අතර තමා වටා ගොඩනැගෙන පාරිසරික සංඝටක වලට සමගාමීව හා ප්‍රතිවිරුද්ධ ලෙස තම ශරීරය භාවිතා කිරීමට මිනිසා හැකියාව ලබා ගත්තේය.

අතීතයේ සිට වර්තමානය තෙක් විවිධ සංස්කෘතික ප්‍රවාහයන් සමඟ මිනිසා තම ශරීරය ප්‍රකාශන මාධ්‍යක් ලෙස හැසිරවීමේ නව ක්‍රම අත්හදා බලන ලදි.

"නර්තනය මිනිසාගේ මූලික අදහස් ප්‍රකාශන මාධ්‍යක් බවට පත්වූයේ එබැවිනි. ශරීරය මගින් නිපදවනු ලබන විවිධ චලන රටා ගොනුවක් භාවයන්ගේ සංකලන සමඟ අවකාශය පුරා විසිර යන අවස්ථාව නර්තනය වශයෙන් සරලව හඳුන්වා දිය හැක."

මුල් කාලීනව නර්තනය ශාන්තිකර්මයක් ලෙස හෝ ප්‍රීතිය හැඟවීමේ ක්‍රමෝපායක් ලෙස පැවති අතර පසු කාලීනව විවිධ සංස්කෘතීන් සමඟ කෙරෙන ගනුදෙනුවක් බවට පත් විය. ඒ සමඟම නර්තනයට සාපේක්ෂ ප්‍රකාශන ශක්තිය පිළිබඳ අවධානය යොමු වූ අතර මේ සියල්ලෙහිම මාධ්‍ය වූ ශරීරය පිළිබඳ ගැඹුරු කතිකාවතක් ආරම්භ විය.

ශරීරය මාධ්‍ය කොට ගත් චලනය සහ භාවයන් විසින් නිපදවන ශාරීරික භාෂාව නර්තනයේ ප්‍රකාශන ශක්‍යතාවය දියුණු කරනුයේ කෙසේද යන්න විවිධ මතවාදයන්ට ප්‍රස්තුත වූ පරීක්ෂණයක් බවට පත් විය.

ශරීරය ආත්ම කොට ගත් නර්තනය තුලින් මානව හැඟීම් සහ සාමාජීය යථාර්ථයන් මෙන්ම නව මතවාදයන් ආදිය ඉදිරිපත් කරනුයේ කෙසේද යන්න පිළිබඳව මෙම පරීක්ෂණයන්ගෙන් වැඩිදුර සාකච්ඡා වූ අතර එමගින් නව නර්තන සංස්කෘතීන් බිහි විය.

මෙතෙක් විශ්වය විසින් බිහි කළ අපූර්වතම නිර්මාණය වූ මිනිස් ශරීරය තුළින් විශ්වීය ප්‍රකාශනයක් ගොඩ නැගීම මේ හැම කතිකාවකම පරමාර්ථය වෙයි. පෙරදිග රස සංකල්පය මෙන්ම අපරදිග භාව විශෝධනය එනම් 'කැතාසීස්කරණය' මගින් අත්හදා බලන ලද්දේද ශරීරයේ භාෂාව ප්‍රකාශන මාධ්‍යයක් ලෙස යොදා ගැනීමේ ශක්‍යතාවයයි.

දහනව වන සියවස අගභාගය වන විට බටහිර පැවති අධිපති නර්තනයන් ප්‍රතික්ෂේප වීම ආරම්භ වූ අතර ස්වභාවික මිනිස් ශරීරය තුළ අඩංගු භාෂාත්මක හැකියාව ප්‍රකාශනාත්මකව නර්තනය බවට පත් කිරීමේ විවිධ ක්‍රමෝපායන් යෝජනා වූ අතර ප්‍රායෝගිකව ඒවා ක්‍රියාත්මක විය.

'ඉසඩෝරා ඩන්කන්', 'මාර්තා ග්‍රැහැම්', 'මර්සි කනිංහැම්' ආදීන් නව නර්තන ක්‍රමවේදයකට අඩිතාලම තැබූ අතර ප්‍රකාශනාත්මක නර්තනයේ ආරම්භයද සනිටුහන් විය.

ජර්මානු ප්‍රකාශනවාදී නර්තනය බ්‍රිතාන්‍ය නව නර්තනය පශ්චාත් නූතනවාදී නර්තනය, පෙරටුගාමී නර්තනය ආදී විවිධ ක්‍රමවේදයන් මතවාදී අදහස් ඔස්සේ නර්තනයේ නව ප්‍රවණතා බිහිකල අතර ශරීරය භාෂාවක් ලෙස නව්‍ය ආකාරයට යොදා ගැනීම පිළිබඳව විවිධ අත්හදා බැලීම් සිදුකරනු ලැබිණි. මේ නිසා නර්තනය හුදු පූජා කර්මයක් ලෙස හෝ සමාජ නර්තනයක් ලෙස පැවති සීමාවන් බිඳ සිනමාව, වේදිකා නාට්‍යය ආදී මාධ්‍යයන් මෙන් ප්‍රබල ප්‍රකාශන හැකියාව සහිත මාධ්‍යයක් බවට පත්වීමේ අඩිතාලම වැටිණි.

ශාරීරික චලනය තුළින් බිහිවන භාෂාව නර්තනයේ ප්‍රකාශනාත්මක හැකියාව තීව්‍ර කරනුයේ කෙසේද; සමාජ යතාර්ථයක් හෝ යම් මතවාදයක් හෝ ගැඹුරට ගිය මානව හැඟීම් ගවේෂණයක් ප්‍රකාශනාත්මකව නර්තනයෙන් ගොඩනැගීම සඳහා ශරීරය භාෂාත්මකව භාවිත කරනුයේ කෙසේද යන්න පිළිබඳව මෙම පරීක්ෂණ නිබන්ධනයෙන් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙයි.

ලාංකේය නර්තන කලාව අවශේෂ ප්‍රකාශන මාධ්‍ය වලට සාපේක්ෂකව සමාජීය යථාර්තය ප්‍රතිනිර්මාණය කල හැකි ප්‍රකාශන මාධ්‍යයක් බවට පත් කිරීමෙහිලා ශරීරය